බුද්ධශාසන අරමුදල - **2019**

**-------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

බුද්ධශාසන අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල පනතේ 12 (4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මූල්‍ය ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ගෙවීම් | 4,260,906 | ආදායකයාගෙන් ලබා ගත් කුවිතාන්සි/ලදුපත් | රු.4,360,906 ක ගෙවීම්වලට අදාල වවුචර් අතරින්,<br>➢ අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කර ඇත.<br>➢ අතිකාල හා ගමන් වියදම් ලද බවට තහවුරුවක් ලබා ගෙන ඉදිරිපත් කල හැක.<br>➢ වෛද්‍යාධාර ගෙවීම් බහුතරයක් ලදුපත් එවා ඇති අතර, වෙනම ගොණුවක එම ලදුපත් ගොණු කර ඇත.<br>➢ සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ මුදල් ගෙවීම් තහවුරු කර ගැනීම සිදු කර විගණනයට ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දෙන ලදී.<br>➢ චීන භාෂා ව්‍යාපෘතියේ ගෙවීම් වලට අදාල ලදුපත් වල පිටපත් මේ සමඟ ඉදිරිපත් කර ඇත.<br>ඉදිරියේදී කරනු ලබන සියළු ගෙවීම් සඳහා ලදුපත් ලබා ගැනීමට අවශ්‍ය උපදෙස් නිලධාරීන් වෙත ලබා දී ඇත. | ගෙවීම ලද බව සනාථ කළ හැකි පරිදි ආදායකයාගෙන් ලබා ගත් කුවිතාන්සි/ලදුපත් අදාල වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතු බව |
| (ආ) | බෞද්ධ ධර්ම ග්‍රන්ථ | 6,953,882 | සමීක්ෂණ මණ්ඩල වාර්තා | සමීක්ෂණ මණ්ඩලයක් පත් කර 2022 වසරට අදාලව ග්‍රන්ථ සමීක්ෂණයක් සිදු කිරීමට සැලසුම් කර ඇත. | සමීක්ෂණයක් සිදු කර වාර්තා ඉදිරිපත් කළ යුතු බව. |
| (ඇ) | සුනාමි ආධාර | 1,348,796 | විස්තරාත්මක තොරතුරු | සුනාමි ආධාර ලෙස සඳහන් රු. 1,348,796 ක ශේෂය 2007 වසරේ සිට පැවත එන ශේෂයකි | ශේෂය සනාථ කළ හැකි තොරතුරු ඉදිරිපත් කළ යුතු බව. |

## 1.6 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396 | 2013 සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදි අරමුදල විසින් නිකුත් කරන ලද, එකතුව රු.56,863 ක් වූ චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට මෙම වාර්තාවේ දිනය වන විටත් පියවර ගෙන නොතිබුණි. | එම චෙක්පත් 07 ආදායමට බැර කිරීමට හැකියාව ඇති බැවින් රජයේ ආදායමට බැර කර වාර්තා කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

## 1.7 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.7.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබූ රු.13,031,828 ක් වූ අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතු ශේෂයෙන් රු.1,087,447 ක් වසර 06 කට සහ රු. 11,944,381 ක් වසර 03 කට වඩා පැරණි ශේෂ බව පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව නිරීක්ෂණය වූ අතර එම ශේෂ අය කර ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි. | එම ශේෂයන් 2023 වසර තුළදී අය කර ගැනීමට උපදෙස් ලබා දී ඇත. | දීර්ඝ කාලයක සිට පැවතෙන ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව |

### 1.7.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබූ රු.1,712,435 ක් වූ ජංගම වගකීම් ශේෂයෙන් රු.1,168,025 ක් වසර 03 කට වඩා පැරණි ශේෂ වූ අතර එම ශේෂ නිරවුල් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | එම ශේෂයන් 2023 වසර තුළදී නිරවුල් කිරීමට හෝ සමුච්චිත අරමුදලට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. | දීර්ඝ කාලයක සිට පැවතෙන ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව |

### 1.7.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 371(2) අනුව යම් නිශ්චිත කාර්යයකට ලබා ගත් අතුරු අග්‍රිම අදාල කාර්යය නිමවූ විගස පියවීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර අත්තිකාරම් පියවීමට දින 14 කට අධික කාලයක් ගත කර තිබූ අවස්ථා 10 ක් සමාලෝචිත වර්ෂය තුළ | ඉදිරියේදී මෙම දුර්වලතා නිවැරදි කර ගැනීමටත් ඉදිරියේදී එවැනි දුර්වලතා ඇති නොවීමට වග බලා ගැනීමටත් නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත | අත්තිකාරම් ගෙවීම් සහ පියවීම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

පැවති අතර අත්තිකාරම් පියවන තෙක් ඉතිරි මුදල් අත රඳවා ගෙන සිට ඇති බව ද නිරීක්ෂණය විය. තවද, අත්තිකාරම් ගෙවීමේදී අදාල මුදල් ලබා ගත් බවට ගෙවීම ලද අයගේ අත්සන ලබා ගැනීමට කටයුතු කර නොතිබූ බව වවුචර් පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.47,513,190 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.41,593,654 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,919,536 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී ආයෝජන ආදායම වැඩිවීමත් සාමණේර කැපකරු දායක මුදල් ගෙවීම සහ සනීපාරක්ෂක කටයුතු සඳහා ආධාර දීම අඩුවීමත් මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 264 හි සඳහන් අවශ්‍යතාවය අනුව සෑම ගෙවීමක්ම වවුචරයේ සඳහන් මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබා ගත්, (අවශ්‍ය විට නිසි පරිදි මුද්දර යෙදූ) කුවිතාන්සියකින් තහවුරු විය යුතු වුවත් බොහෝ ගෙවීම් වවුචර් සමඟ වෙනත් ගෙවීම්වලට අදාල රිසිට්පත්/ලදුපත් පරීක්ෂා කිරීමකින් තොරව අමුණා තිබුණි | සාමණේර ආයතන ගෙවීම් සම්බන්ධයෙන් මෙම විමසීම ඉදිරිපත් වී ඇති අතරසාමණේර , ආයතන ගෙවීම් සිදු කරනු ලබන්නේ කලින් සිදු කළ ගෙවීම ලද බවට ලදුපතක් ලැබීමෙන් පසුව පමණිජ් අනුව කලින් සිදු කල ගෙවීමට අදාල ලදුපත ලැබුණු බව සහතික කරගත හැකි වනපරිදි නව ගෙවීම් වවුචරයට ලදුපත ඇමිණීම සිදු කර ඇත .<br><br>වර්තමාන ගෙවීම්වලට අදාල ලදුපතේ පිටපතක් අදාල ගෙවීම් වවුචරයට ඇමිණීම සිදු කරනු ලබයි. 2022, 2021 සහ 2020 වසරවලට අදාලව එම නිවැරදි කිරීම් සිදු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව, අදාල ගෙවීම ලද බව සනාථ කළ හැකි පරිදි ආදායකයාගෙන් ලබා ගත් කුවිතාන්සි/ලදුපත් ඊට අදාල වවුචරයට අමුණා ඉදිරිපත් කළ යුතු බව |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී රු.57,550,091 ක් අරමුදලේ ආදායම් ලෙස ලැබී තිබුණ ද එයින් රු.10,036,901 ක් එනම් සියයට 17 ක් පමණක් අරමුදලේ අරමුණු වෙනුවෙන් වැයකර තිබුණි. තවද, වාර්ෂිකව අතිරික්ත වන මුදල් ආයෝජනය කර තිබූ අතර | ඉදිරියේදී අරමුදලට ලැබෙන ආදායම් පදනම් කරගෙන ඊට සරිලන අන්දමේ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට යෝජිතය | අරමුදලට ලැබෙන ආදායමට සරිලන අන්දමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු බව |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු ආයෝජන වටිනාකම රු.559,016,242 ක් විය. බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම අරභයා ඉතාමත් යෝග්‍ය කාර්යයන් සඳහා මුදල් යෙදවීම අරමුදලේ කාර්යභාරය වුවද, වාර්ෂිකව අරමුදලට ලැබෙන ආදායමට සරිලන අන්දමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය මඟින් ඇතුළත් කරන ලද මුදල් රෙගුලාසි 877(2) (ඇ) රෙගුලාසිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, වර්ෂ දෙකකුත් මාස 09 ක කාල පමාවකින් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් මත මෙම අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් සිදු වී ඇති බැවින් ඉදිරියේදී නියමිත කාල රාමුව තුළ විගණනයට ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ ප්‍රකාරව නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු බව |